# මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය-2011

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1:1. මතය

2011 දෙසැම්බර් 31 දිනට මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබිඹු කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1:2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1:2:1. නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

2003 ජුනි 02 දින හා අංක. පීඊඩී/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වල ඌණතාවය රු.149,080 ක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.435,775 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම රු. 584,855 ක් විය. අධ්‍යයන දීමනා වැඩිවීම හා උපදේශක සේවාවක් සපයා ගැනීම වෙනුවෙන් අමතරව වියදම් දරා තිබීම මෙයට විශේෂයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3:1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශිෂ්‍යත්ව ලාභියකු දර්ශනවේදී උපාධියක් වසර 03 සිට 05 දක්වා කාල සීමාවක් තුල අවසන් කල යුතු වුවත් 2005 වර්ෂයේ පශ්චාත් උපාධි පාඨමාලා ප්‍රදානලාභීන් හැටදෙනෙකු අතරින් විසි දෙදෙනකුද 2006 වර්ෂයේදී පශ්චාත් උපාධි පාඨමාලා ප්‍රදානලාභින් පනස්නවදෙනෙකු අතරින් විසිඑක්දෙනෙකුද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් පාඨමාලාව අවසන් කර නොතිබුණි.

(ආ) 2005 සිට 2011 වර්ෂය දක්වා කාලය තුල ප්‍රදානය කර පසුව අවලංගුකර තිබු ප්‍රදානලාභීන් 04 දෙනෙකු වෙනුවෙන් ගෙවා තිබු ප්‍රදාන මුදලින් රු.2,621,897 ක් අදාල ආයතන වලින් අයකර ගෙන නොතිබුණි.

(ඇ) පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව ප්‍රදානලාභින් 04 දෙනෙකුගෙන් අර්ධ වාර්ෂික ප්‍රගති වර්තා නියමිත පරිදි ගෙන්වා ගැනිමට කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### (අ) සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දින හා අංක. පීඊඩී/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5.1.2 ජේදය ප්‍රකාරව 2011-2015 සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී පහත අංගයන් එහි ඇතුලත් කර නොතිබුණි.

(i) ආයතනය සතු සම්පත්
(ii) පසුගිය වර්ෂ 3 ක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනය
(iii) අරමුණු හා ඉලක්ක ඉටුකිරීම සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම් පැහැදිලිව දැක්වෙන පරිදි සකස්කළ ක්‍රියාකාර් සැලැස්ම
(iv) කාර්ය සාධක දර්ශක

### (ආ) ක්‍රියාකාර් සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාර් සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළ පුහුණු වැඩමුළු 04 ක් සම්මන්ත්‍රණ 03 ක් පර්යේෂණ සමුළුවක් හා විද්වත් රැස්වීම් 06 ක් පැවැත්වීමට සැළසුම් කර තිබුණද පුහුණු වැඩමුළු, සම්මන්ත්‍රණ හා විද්වත් රැස්වීම් 01 බැගින් පවත්වා තිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ). ශිෂ්‍යත්ව ප්‍රදානය

(ආ). බඳවා ගැනීම්

(ඇ). ඉලෙක්ට්‍රොනික් පුස්තකාල පරිපාලනය